වික්ටෝරියාවේ නව ළමා ආරක්ෂණ ප්‍රමිති

What's new?
Overview of the new Child Safe Standards

Sinhalese

# නවතම කාරණා මොනවාද?

## නව ළමා ආරක්ෂණ ප්‍රමිති පිළිබඳ දළ විශ්ලේෂණය

ළමා ආරක්ෂණ ප්‍රමිති (ප්‍රමිති) වික්ටෝරියාවේ 2016 ජනවාරි මාසයේදී ආරම්භ විය. වසර පහකට පසු, **මෙම** ප්‍රමිති හේතුවෙන් ළමයින්ගේ හා තරුණයින්ගේ ආරක්ෂාව වැඩිදියුණු වී ඇති ආකාරය අපි දැක ඇත්තෙමු.

අපගේ ප්‍රමිති වඩාත් ශක්තිමත් කිරීම සඳහා වෙනස්කම් සිදු කෙරෙමින් පවතී.

[1]ප්‍රමිති මගින් ආවරණය වන සංවිධාන **2022 ජූලි 1** වන විට නව ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. ඒ වනතුරු වර්තමාන ප්‍රමිති යෙදේ.

නව ප්‍රමිති අවම අවශ්‍යතා දක්වා ඇති අතර ළමයින් සහ තරුණයින් ආරක්ෂිතව තබා ගැනීම සඳහා සංවිධාන විසින් ගත යුතු ක්‍රියාමාර්ග පෙන්වයි. ඒවා සංවිධාන සඳහා වඩාත් පැහැදිලි බව ලබා දෙන අතර ඕස්ට්‍රේලියාවේ අනෙකුත් ප්‍රදේශවල ප්‍රමිති සමග වඩා අනුකූල වේ.

ළමයින් සහ තරුණයින් ආරක්ෂිතව තබා ගැනීම සඳහා සංවිධාන දැනටමත් කර ඇති දේ නව ප්‍රමිතිවලට අනුකූල වීමට ඔවුන්ට උපකාරී වෙයි. සමහර අවස්ථාවලදී, නව ප්‍රමිති සපුරාලීම සඳහා ආයතනවලට ඔවුන්ගේ වර්තමාන ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති, භාවිත සහ ආයතනික සංස්කෘතිය වෙනස් කිරීමට හෝ සංවර්ධනය කිරීමට අවශ්‍ය වෙයි.

නව ප්‍රමිති දැන ගැනීමට සහ නව ප්‍රමිතිවලට අනුකූල වීම සඳහා ඔවුන් ගත යුතු නව ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සඳහා ඔවුන්ගේ ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ භාවිත සමාලෝචනය කිරීම ආරම්භ කිරීමට මෙම මාර්ගෝපදේශය ආයතනවලට උපකාරී වෙයි. *වෙනස් වන්නේ කුමක්ද?* යන මාර්ගෝපදේශය ද *වර්තමාන සහ නව ළමා ආරක්ෂණ ප්‍රමිති සසඳා බලන්න* සහ කොමිසමේ *නිතර අසනු ලබන ප්‍රශ්න* යන මාර්ගෝපදේශ ද ඔබට ප්‍රයෝජනවත් විය හැකිය.

සංවිධානවලට සහය වීම සඳහා ඉදිරි මාසවලදී වැඩිදුර තොරතුරු සහ උපදෙස් දෙනු ලැබේ, කොමිසම විසින් නව තොරතුරු සහ මාර්ගෝපදේශ නිකුත් කෙරෙන විට ඊ-තැපැල් ලබා ගැනීමට ඔබට මෙහි ග්‍රාහක විය හැක.

පහත වගුව නව ප්‍රමිතිවල නව අවශ්‍යතාවල සාරාංශයක් දෙයි.

[1] ප්‍රවේශ වීමේ හේතු මත 'අදාළ ආයතන' පිළිබඳ සියලු යොමු කිරීම් මෙම ලේඛනයේ 'සංවිධාන/ ය' සමග ප්‍රතිස්ථාපනය කර ඇත. අදාළ ආයතනයක් *2005, ළමා යහපැවැත්ම සහ ආරක්ෂාව පිළිබඳ පනතේ* 3(1) වගන්තියෙන් අර්ථ දක්වා ඇති අතර ළමා ආරක්ෂණතා ප්‍රමිතිවලට යටත් වන ආයතන මේ සඳහා අදාළ කර ගනියි.

| නව ළමා සුරක්ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
|---|---|---|
| **ළමා ආරක්ෂණ ප්‍රමිතිය 1 - ආදිවාසී ළමයින්ගේ හා තරුණයින්ගේ විවිධාකාර හා අද්විතීය අනන්‍යතා සහ අත්දැකීම්වලට ගරු කරන හා අගය කරන සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් සංවිධාන විසින් ස්ථාපිත කරනු ලැබේ**<br>ළමා ආරක්ෂණ ප්‍රමිතිය 1 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු අවස්ථා වන්නේ:<br>1.1 දරුවෙකුට ඔවුන්ගේ සංස්කෘතිය ප්‍රකාශ කිරීමට සහ ඔවුන්ගේ සංස්කෘතික අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති හැකියාව දිරිමත් කිරීම සහ ක්‍රියාකාරීව සහය දීම කරනු ලැබේ.<br>1.2 ආදිවාසී සංස්කෘතියේ ශක්තීන් පිළිගැනීමට හා අගය කිරීමට සහ ආදිවාසී ළමයින්ගේ හා තරුණයින්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සඳහා එහි වැදගත්කම අවබෝධ කර ගැනීමට සියලු සාමාජිකයින්ට උපකරණ වන උපාය මාර්ග සංවිධානය තුළ අන්තර්ගත වේ.<br>1.3 සංවිධානය තුළ ජාතිවාදී අවස්ථා හඳුනා ගැනීම, මුහුණ දීම සහ නොඉවසීම සහතික කිරීම ගැන සංවිධානය විසින් කටයුතු කරනු ලැබේ. ජාතිවාදයේ ඕනෑම අවස්ථාවක් කෙරෙහි සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.<br>1.4 ආදිවාසී ළමයින්, තරුණයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ඊට සහභාගී වීමට හා ඇතුළත් කිරීමට සංවිධානය ක්‍රියාකාරීව සහය සහ පහසුකම් සපයයි.<br>1.5 සංවිධානයේ සියලුම ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, පද්ධති සහ ක්‍රියාවලින් එක්ව සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත සහ සියල්ල ඇතුළත් පරිසරයක් නිර්මාණය කරන අතර ආදිවාසී ළමයින්ගේ, තරුණයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අවශ්‍යතා සපුරාලයි. කළ | නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 1 ආදිවාසී ළමයින්ට සහ තරුණයින්ට සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නව පියවර ගැනීමට අවශ්‍ය කරයි. ආදිවාසී ළමයින් සහ තරුණයින් දැනට ඔවුන්ගේ සේවා හෝ පහසුකම් භාවිත කරන බව ඔවුන් දැන සිටියත් නැතත් සංවිධාන මෙම අවශ්‍යතාව සපුරාලිය යුතුය.<br>මෙම නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 1 යන්නෙන් අදහස් කෙරෙන්නේ ආදිවාසී ළමයින්ට සහ තරුණයින්ට සහ ඔවුන්ගේ පවුල් සඳහා ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා බොහෝ සංවිධාන සිදු කරන ඔවුන්ගේ වර්තමාන ප්‍රවේශ වඩාත් වැඩිදියුණු කළ යුතු බවයි. මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම සඳහා එක් වරක් පමණක් වෙනස් කිරීමක් නොව අඛණ්ඩ උත්සාහය අවශ්‍ය වේ.<br>මෙම ප්‍රමිතිය නව ප්‍රමිති 5 සමග සම්බන්ධ වන අතර එමඟින් සමානාත්මතාවය තහවුරු කළ යුතු අතර ආයතන විසින් විවිධ අවශ්‍යතාවලට ගරු කළ යුතු වෙයි. | නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 1 ට අනුකූල වීම සඳහා ආයතනවලට සහය වීම සඳහා කොමිසම නව ඒ සඳහාම වෙන් වූ සම්පත් සංවර්ධනය කරමින් සිටී.<br>ජාතික ආදිවාසී හා දූපත් ළමා ආරක්ෂණ ලේකම් කාර්යාලය (SNAICC) විසින් ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධියේ දූපත් වැසියන්, තරුණයින් සහ ප්‍රජාවන් සමඟ වැඩ කරන සංවිධානවලට ළමා ආරක්ෂණ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සම්පත් සංවර්ධනය කර ඇත.<br>කොමිසම් සභාවේ ළමා ආරක්ෂණ සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශයෙහි 'විවිධත්වයට හා සංස්කෘතික වෙනසකට ගරු කිරීම තුළින් ළමා ආරක්ෂාව' යන කොටසේ අදාළ මාර්ගෝපදේශ ඇත. |

| නව ළමා සුරක්ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
|---|---|---|
| **ළමා ආරක්ෂණ ප්‍රමිති 2 - ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම සංවිධානයේ නායකත්වය, පාලනය සහ සංස්කෘතිය තුළ අන්තර්ගත වේ**<br><br>ළමා ආරක්ෂණ ප්‍රමිතිය 2 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br><br>2.1 ළමා ආරක්ෂාව සඳහා සංවිධානය පොදු කැපවීමක් කරයි.<br><br>2. 2 ළමා ආරක්ෂණ සංස්කෘතියක් සංවිධානයේ සෑම තරාතිරමකම ඉහළ සිට පහළට සහ පහළ සිට ඉහළට ව්‍යාප්ත කර ඇති අතර එයට ඉස්තරම් සහයෝගයක් ලබා දී ඇත<br><br>2.3 පාලන විධිවිධාන සෑම මට්ටමකම ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයයි.<br><br>2.4 චර්යාධර්ම පද්ධතිය මගින් කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට අපේක්ෂිත චර්යාත්මක ප්‍රමිති සහ වගකීම් පිළිබඳ මාර්ගෝපදේශ සපයයි.<br><br>2.5 අවදානම් කළමනාකරණ උපාය මාර්ග මගින් ළමයින්ට සහ තරුණයින්ට ඇති අවදානම් වැළැක්වීම, හඳුනා ගැනීම සහ අවම කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.<br><br>2.6 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් තොරතුරු හුවමාරු කර ගැනීම සහ වාර්තා තබා ගැනීම පිළිබඳ ඔවුන්ගේ යුතුකම් තේරුම් ගනී. | නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 2 හි අඩංගු වන බොහෝ අංගයවල සඳහන් වන්නේ දැනට පවත්නා ප්‍රමිති 1, 2 සහ 3 යටතේ ආයතන කළ යුතු දේ පිළිබඳව ය.<br><br>ආයතනයක සෑම තරාතිරමකම ළමා ආරක්ෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා තොරතුරු හුවමාරු කිරීම, වාර්තා තබා ගැනීම සහ පාලන විධිවිධාන කෙරෙහි නව ළමා ආරක්ෂණ ප්‍රමිති 2 වැඩි අවධානය යොමු කරයි. ළමයින් කෙරෙහි ඇති අවදානම් කළමනාකිරීම ආයතනික නායකත්වයට, පාලනයට සහ සංස්කෘතිය තුළට ඇතුළත් කිරීම අවශ්‍ය කරයි. | කොමිසම් සභාවේ ළමා ආරක්ෂණ සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශයෙහි වර්තමාන ප්‍රමිති 1, 2 සහ 3 යන අංශවල අදාළ මාර්ගෝපදේශ ඇත.<br><br>නිව් සවුත් වේල්ස් හි ළමා ආරක්ෂකයින්ගේචර්යාධර්ම පද්ධතිය: ළමා සුරක්ෂණ චර්යාධර්ම පද්ධතියක් ඇතිකිරීමේ මාර්ගෝපදේශය ළමා ආරක්ෂිත චර්යාධර්ම පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා පුළුල් උපදෙස් සපයයි.<br><br>ජාතික මූලධර්මය 1 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |

| නව ළමා සුරක්‍ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
|---|---|---|
| **ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 3 - ළමයින්ට සහ තරුණයින්ට ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුම්දී ඇති අතර, ඔවුන්ට බලපාන තීරණවලට සහභාගී වීමේ හැකියාව ඇති අතර  ඔවුන්ට වැදගත් ලෙසසලකනු ලැබේ**<br><br>ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 3 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br><br>3.1 ළමයින්ට සහ තරුණයින්ට ආරක්‍ෂාව, තොරතුරු සහ සහභාගීත්වය ඇතුළුව ඔවුන්ගේ සියලු අයිතිවාසිකම් පිළිබඳව දැනුම් දෙනු ලැබේ.<br><br>3.2 මිත්‍රත්වයේ වැදගත්කම පිළිගෙන ඇති අතර, ළමයින්ට සහ තරුණයින්ට ආරක්ෂිත බව දැනීමට හා අඩු තනිකමක් දැනීමට සම වයසේ මිතුරන්ගෙන් ලැබෙන සහයෝගය දිරිගන්වනු ලැබේ.<br><br>3.3 සැකසුමට හෝ වැඩසටහනට අදාළ වන විට, ළමයින්ට සහ තරුණයින්ට ලිංගික අපයෝජන වැළැක්වීමේ වැඩසටහන් සහ අදාළ තොරතුරු වයස් මට්ටමට සුදුසු ලෙස ලබා ගත හැකිය.<br><br>3.4 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් හානිකර සංඥාවලට සංවේදී වන අතර ළමයින්ට සහ තරුණයින්ට තම අදහස් ප්‍රකාශ කිරීමට, තීරණ ගැනීමේදී සහභාගී වීමට සහ ඔවුන්ගේ ගැටලු මතු කිරීමට ළමා හිතකාමී මාර්ගවලට පහසුකම් සපයයි.<br><br>3.5 සංවිධානවල ළමයින්ගේ හා තරුණයින්ගේ දායකත්වයට ප්‍රතිචාර දැක්වීමට පහසුකම් සපයන සංස්කෘතියක් වර්ධනය කිරීම සඳහා උපාය මාර්ග ඇත.<br><br>3.6 සංවිධාන ළමයින්ට සහ තරුණයින්ට සහභාගී වීමට අවස්ථාව ලබා දී ඔවුන්ගේ දායකත්වයට ප්‍රතිචාර දක්වන අතර එමඟින් විශ්වාසය හා ක්‍රියාකාරීත්වය ශක්තිමත් කරයි. | ළමයින් සහ තරුණයින් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සංවිධානවල ළමා ආරක්‍ෂණ ප්‍රමිතිවලට අනුකූලව සැමවිටම අවශ්‍ය වේ. මෙම වගකීම් රැඳී පවතී.<br><br>නව ළමා ආරක්‍ෂණ ප්‍රමිති 3 යටතේ ඇති සංවිධාන සඳහා අමතර අවශ්‍යතාවලට ඇතුළත් වන්නේ:<br>• ළමයින්ට හා තරුණ ප්‍රජාවට ඔවුන්ගේ අයිතිවාසිකම් ගැන දැනුවත් කිරීම<br>• මිත්‍රත්වයේ වැදගත්කම පිළිගෙන ඇති අතර, ළමයින්ට සහ තරුණයින්ට ආරක්ෂිත බව දැනීමට හා සම්බන්ධිත බවක් දැනීමට සම වයසේ මිතුරන්ගෙන් ලැබෙන සහයෝගය දිරිගන්වනු ලැබේ.<br>• ළමයින්ට සහ තරුණයින්ට ලිංගික අතවර වැළැක්වීමේ වැඩසටහන් අදාළ අවස්ථාවලදී ලබා දීම<br>• ළමයින්ට සිදු විය හැකි හානිවල ලක්‍ෂණ හඳුනා ගැනීමට සේවකයින් හා ස්වෙච්ඡා සේවකයින් දැනුවත් කරවීම. | කොමිසම් සභාවේ සවිබල ගැන්වීම සහ සහභාගීත්වය: ළමුන් හා තරුණයින් සමඟ වැඩ කරන සංවිධාන සඳහා මාර්ගෝපදේශය ආයතන සවිබල ගැන්වීම සහ සහභාගීත්වය ඇති කිරීම සහ එය ක්‍රියාවට නැංවිය යුතු ආකාරය පිළිබඳ ප්‍රායෝගික, පහසුවෙන් ලබා ගත හැකි මග පෙන්වීමක් සපයයි.<br><br>බොහෝ ළමයින්ගේ අයිතිවාසිකම් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යටතේ ස්ථාපිත කර ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් සරල අනුවාදයක් නිකුත් කර ඇත.<br><br>පාසල් සඳහා අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුවේ පාසල් සඳහා මග පෙන්වීම තුළ විවිධ අපයෝජන වර්ගවල සලකුණු පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු තිබේ.<br><br>කොමිසම් සභාවේ ළමා ආරක්‍ෂණ සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශයෙහි වර්තමාන ප්‍රමිති 7 යන අංශවල අදාළ මාර්ගෝපදේශ ඇත.<br><br>ජාතික මූලධර්මය 2 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්‍ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |

| නව ළමා සුරක්‍ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
|---|---|---|
| **ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 4 - පවුල් සහ ප්‍රජාවන් දැනුවත් කර ඇති අතර ළමා ආරක්‍ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට සම්බන්ධ වේ**<br><br>ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 4 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br><br>4.1 තම දරුවාට බලපාන තීරණවලට පවුල සහභාගී වේ.<br><br>4.2 සංවිධානය තම ළමයින්ගේ ආරක්ෂිත ආකල්පය පිළිබඳව පවුල් හා ප්‍රජාව සමඟ විවෘතව සන්නිවේදනය කරන අතර අදාළ තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත.<br><br>4.3 සංවිධානයේ ප්‍රතිපත්ති හා භාවිතයන් සංවර්ධනය කිරීමේදී හා සමාලෝචනය කිරීමේදී අදහස් සැපයීමට පවුල් සහ ප්‍රජාවන්ට යම් අයිතියක් ඇත.<br><br>4.4 සංවිධානයේ මෙහෙයුම් සහ පාලනය පිළිබඳව පවුල්, රැකබලා ගන්නන් සහ ප්‍රජාව දැනුවත් කරනු ලැබේ. | වර්තමාන ළමා ආරක්‍ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීමේ කොටසක් ලෙස බොහෝ සංවිධාන දැනටමත් පවුල් සහ ප්‍රජාවන් දැනුවත් කර සහ සහභාගී කර ඇත.<br><br>නව ළමා ආරක්‍ෂණ ප්‍රමිති 4 ළමයින්ගේ ආරක්‍ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා පවුල් සහ ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම සඳහා සංවිධානවලට නිශ්චිත බැඳීම් ඇති කරයි.<br><br>නව බැඳීම්වලින් අදහස් වන්නේ සංවිධාන පහත දේවල් සහතික කළ යුතු බවයි:<br>• ළමයින්ට සහ තරුණයින්ට බලපාන තීරණවලදී පවුල් සහ ප්‍රජාවන්ගේ අදහස් විමසන්න<br>• ළමා ආරක්‍ෂණ ප්‍රතිපත්ති හා භාවිතයන් වර්ධනය හා සමාලෝචනයේදී පවුල් හා ප්‍රජාවන් සම්බන්ධ කරගන්න<br>• ළමා ආරක්‍ෂාව පිළිබඳ ගැටළු මතු කරන්නේ කෙසේද සහ සංවිධානය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න පිළිබඳව පවුල් සහ ප්‍රජාවන් සමඟ ඵලදායී ලෙස සන්නිවේදනය කරන්න<br>• පවුල්වල විවිධත්වය සැලකිල්ලට ගෙන සහභාගී වීමට ඇති බාධක අවම කිරීමට කටයුතු කරන්න. | ළමා ආරක්‍ෂණ සංවිධානයක් ඇතිකිරීමේ මාර්ගෝපදේශයේ පවුල් හා සංවිධාන එකතු කරගැනීම දැනටමත් හොඳ ක්‍රියාවක් ලෙස දක්වා ඇත.<br><br>ජාතික මූලධර්මය 3 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්‍ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |

| නව ළමා සුරක්ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
|---|---|---|
| **ළමා ආරක්ෂණ ප්‍රමිතිය 5 - ප්‍රතිපත්ති හා භාවිතයේ දී සමානාත්මතාවය තහවුරු කර ඇති අතර විවිධ අවශ්‍යතාවලට ගරු කරනු ලැබේ**<br><br>ළමා ආරක්ෂණ ප්‍රමිතිය 5 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br><br>5.1 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් ඇතුළුව සංවිධානය ළමයින් සහ තරුණයින්ගේ විවිධ තත්වයන් අවබෝධ කර ගන්නා අතර අවදානමට ලක් වූවන්ට සහාය සහ ප්‍රතිචාර ලබා දෙයි.<br><br>5.2 ළමයින්ට සහ තරුණයින්ට සංස්කෘතිට අනුකූලව ආරක්ෂිත, සහ තේරුම් ගැනීමට පහසු වන ආකාරයෙන් තොරතුරු, සහාය සහ පැමිණිලි ක්‍රියාවලි වෙත ප්‍රවේශය ඇත.<br><br>5.3 ආබාධිත ළමයින් සහ තරුණයින්, සංස්කෘතික හා භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වල සිටින ළමයින් සහ තරුණයින්, නිවසේ ජීවත් වීමට නොහැකි අය සහ සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික හා අන්තර් ලිංගික ළමයින් සහ තරුණ තරුණියන්ගේ අවශ්‍යතා පිළිබඳව මෙම සංවිධානය විශේෂ අවධානය යොමු කරයි.<br><br>5.4 මෙම සංවිධානය ආදිවාසී ළමයින්ගේ හා තරුණයින්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරන අතර ඔවුන්ට සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් සපයයි / ප්‍රවර්ධනය කරයි. | ළමා ආරක්ෂණ ප්‍රමිතිවලට අනුකූලව සැම විටම සංවිධානවලින් අවශ්‍ය වී ඇත්තේ විවිධත්වය හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම සහ සමහර ළමයින් අනෙක් අයට වඩා අපයෝජනයට ලක් විය හැකි බව තේරුම් ගැනීමයි. අද වන විට ආදිවාසී ළමයින්ගේ, සංස්කෘතික හා/ හෝ භාෂාමය වශයෙන් විවිධ වූ ළමයින්ගේ සංස්කෘතික ආරක්ෂාව සහ ආබාධිත ළමයින්ගේ ආරක්ෂාව සම්බන්ධ මූලධර්ම තුනක් මගින් මෙය ප්‍රකාශ කර ඇත.<br><br>මෙම වගකීම් අඛණ්ඩව පැවතුනත් නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 5 මඟින් අමතර වගකීම් කිහිපයක් පැහැදිලි කරන අතර, එමඟින් සංවිධානවලට:<br>• ළමයින්ගේ සහ තරුණයින්ගේ විවිධ පසුබිම්, තත්ත්ව සහ අවශ්‍යතා තේරුම් ගැනීම<br>• අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් කර සියලුම ළමයින්ට සහ තරුණයින්ට සමාන ආරක්ෂාව ලබා දීම<br>• නිවසේ ජීවත් වීමට නොහැකි ළමයින්ගේ මෙන්ම සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති ලිංගික සහ අන්තර් ලිංගික ළමයින්ගේ සහ තරුණයින්ගේ අවශ්‍යතා සලකා බැලීමට සිදුවේ.<br><br>ළමුන්ගේ විවිධ තත්ත්ව අවබෝධ කර ගැනීම කෙරෙහි නව ප්‍රමිතිවල අවධානය යොමු වී ඇති හෙයින්, ද්විමය නොවන සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ විවිධ වූ ළමයින්ගේ අවශ්‍යතා කෙරෙහි සංවිධාන අවධානය යොමු කළ යුතුය.<br><br>මෙම ප්‍රමිතිය නව ප්‍රමිතිය 1 ට සම්බන්ධ වීමෙන්, ආදිවාසී ළමයින්ගේ හා තරුණයින්ගේ විවිධාකාර හා අද්විතීය අනන්‍යතා සහ අත්දැකීම්වලට ගරු කරන හා අගය කරන සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් සංවිධාන විසින් ස්ථාපිත කරනු ලැබේ. | කොමිසමෙහි ළමා ආර්ක්ෂිත සංවිධානයක් ගොඩනැගීමේ මාර්ගෝපදේශයෙහි විවිධ තරුණ තරුණියන්ගේ, විශේෂයෙන් ආදිවාසී ළමයින්ගේ, සංස්කෘතික හා / හෝ භාෂාමය වශයෙන් විවිධ වූ ළමයින්ගේ සහ ආබාධ සහිත ළමයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රයෝජනවත් මග පෙන්වීම සපයයි.<br><br>ජාතික මූලධර්මය 4 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |

| නව ළමා සුරක්ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
|---|---|---|
| **ළමා ආරක්ෂණ ප්‍රමිතිය 6 - ළමයින් සහ තරුණයින් සමග වැඩ කිරීමට සුදුසු  පුද්ගලයින් යොදවා ඇති අතර ඔවුන්ට ප්‍රායෝගිකව ළමා ආරක්ෂාව සහ යහපැවැත්මේ වටිනාකම් පිළිබිඹු කිරීමට සහයෝගය සලසා ඇත**<br><br>ළමා ආරක්ෂණ ප්‍රමිතිය 6 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br><br>6.1 දැන්වීම්, තීරක පරීක්ෂා සහ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා පූර්ව-රැකියා පරීක්ෂාව ඇතුළු ඇබෑර්තුවලට බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළින් ළමයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම අවධාරණය කරයි.<br><br>6.2 අදාළ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් ළමා පරීක්ෂා හෝ ඊට සමාන වර්තමානයේ වලංගු පසුබිම් පරීක්ෂා ලබා ගෙන ඇත.<br><br>6.3 සියලුම කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට වාර්තා තබා ගැනීම, තොරතුරු හුවමාරු කර ගැනීම සහ වාර්තා කිරීමේ යුතුකම් ඇතුළුව ළමයින්ට සහ තරුණයින්ට ඔවුන්ගේ වගකීම් පිළිබඳව සුදුසු දැනුවත් කිරීමක් හා පුහුණුවක් ලබා දී ඇත.<br><br>6.4 දැනට පවත්නා අධීක්ෂණය සහ පුද්ගලයින් කළමනාකරණය ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරයි. | වර්තමාන ළමා ආරක්ෂණ ප්‍රමිතිවලට අනුකූලව දැනටමත් සංවිධානවල බඳවා ගැනීම් හා තෝරා ගැනීමේ ක්‍රියාවලින්, පරීක්ෂා කිරීම, අධීක්ෂණය, පුහුණුව, සංවර්ධනය සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සඳහා ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි තිබිය යුතුය. ළමා ආරක්ෂණ ගැටලු සඳහා සංවිධානයේ වාර්තාකරණ ක්‍රියා පටිපාටි පිළිබඳව කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් දැනුවත් කිරීම ද ඔවුන් කළ යුතු වේ.<br><br>නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 6 යටතේ, පහත කාරණා පිළිබඳ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් දැනුවත් කිරීමට ආයතනවලට නව යුතුකම් ඇත:<br>• ළමා ආරක්ෂාවට සහ යහපැවැත්මට අදාළව ආයතනයේ වාර්තා තබා ගැනීමේ ක්‍රියාවලි<br>• තොරතුරු හුවමාරු කිරීම සහ වාර්තා කිරීමේ යුතුකම්. | කොමිසමේ ළමා ආරක්ෂණ සංවිධානයක් නිර්මාණය කිරීමේ මාර්ගෝපදේශය තුළ ළමුන්ගේ ආරක්ෂාව සඳහා සහය වන කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් බඳවා ගැනීම සහ තෝරා ගැනීමේ ක්‍රියාවලි, පරීක්ෂණ, අධීක්ෂණය, පුහුණුව, සංවර්ධනය සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම පිළිබඳ පුළුල් මග පෙන්වීමක් ඇත.<br><br>ජාතික මූලධර්මය 5 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |

| නව ළමා සුරක්‍ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
| --- | --- | --- |
| **ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 7 - ගැටලු හා චෝදනා සඳහා ඇති ක්‍රියාවලියෙන් ළමයින් වෙත අවධානය යොමු කර ඇත**<br><br>ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 7 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br><br>7.1 පහසුවෙන් ලබා ගත හැකි, ළමයින් ඉලක්ක කරගත් පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තියක් සංවිධානයට ඇති අතර, එහි නායකත්වයේ, කාර්ය මණ්ඩලයේ සහ ස්වේච්ඡා සේවකයන්ගේ කාර්යභාර සහ වගකීම්, විවිධ ආකාරයේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ආකාර, අදාළ ප්‍රතිපත්ති හෝ චර්යාධර්ම පද්ධතිය උල්ලංඝනය පිළිබඳව සහ එම අවස්ථාවලදී ක්‍රියා කිරීමට හා වාර්තා කිරීමට ඇති යුතුකම් ගැන පැහැදිලිව සඳහන් වේ.<br><br>7.2 ඵලදායී පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලි ළමුන් සහ තරුණයින්, පවුල්, කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් විසින් වටහා ගෙන ඇති අතර සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත වේ.<br><br>7.3 පැමිණිලි බැරෑරුම් ලෙස සලකනු ලබන අතර ක්‍ෂණිකව හා තරයේ ප්‍රතිචාර දක්වයි.<br><br>7.4 නීතියට වාර්තා කිරීම අවශ්‍ය වුවත් නැතත්, අදාළ බලධාරීන්ට පැමිණිලි සහ උත්සුක වාර්තා කිරීම සහ නීතිය බලාත්මක කරන්නන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවිධානය සතුව ඇත.<br><br>7.5 වාර්තාකරණය, පෞද්ගලිකත්වය සහ රැකියා නීති බැඳීම් සපුරාලයි. | වර්තමාන ළමා ආරක්‍ෂණ ප්‍රමිති මගින් ළමයින්ට සහ තරුණයින්ට පැමිණිලි ඉදිරිපත් කිරීමට සහය වන ඵලදායී ක්‍රියාදාම තිබිය යුතු අතර සැක සහිත ළමා අපයෝජනවලට නිසි ප්‍රතිචාර දැක්වීමට සහ වාර්තා කිරීමට සංවිධානයට හැකි බව සහතික කරයි.<br><br>නව ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 7 මගින් කාර්ය මණ්ඩලවලට සහ ස්වේච්ඡා සේවකයින්ට අමතරව ළමයින් සහ තරුණයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට පැමිණිලි ක්‍රියාවලි මගින් ළමයින් **වෙත අවධානය යොමු** කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.<br><br>නව ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 7 ආයතන මගින් පහත ඒවාට ඇති යුතුකම් ද පැහැදිලි කරයි:<br>• පැමිණිලි බැරෑරුම් ලෙස සැලකීම, ඒවාට ක්‍ෂණිකව හා තරයේ ප්‍රතිචාර දැක්වීම<br>• නීති බලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම<br>• වාර්තාකරණය, පෞද්ගලිකත්වය සහ රැකියා නීති බැඳීම් සපුරාලීම | කොමිසමේ ළමා ආරක්‍ෂණ සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි වාර්තා කිරීම සඳහා අදාළ උපදෙස් සපයයි. කොමිසම් සභාවේ වෙබ් අඩවියේ මෙම යෝජනා ක්‍රමයට යටත් වන සංවිධාන සඳහා වාර්තා කළ හැකි හැසිරීම් යෝජනා ක්‍රමය පිළිබඳ මග පෙන්වීම ඇත.<br><br>ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික කාර්යාලය විසින් ළමයින් ඉලක්ක කර ගත් සහ ප්‍රවේශ විය හැකි පැමිණිලි ක්‍රියාවලියක් නිර්මාණය කිරීම සඳහා සම්පත් ප්‍රකාශයට පත් කර ඇත.<br><br>ජාතික මූලධර්මය 6 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්‍ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |

| නව ළමා සුරක්‍ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
|---|---|---|
| **ළමා ආරක්‍ෂණ ප්‍රමිති 8 - අඛණ්ඩ අධ්‍යාපනය සහ පුහුණුව තුළින් ළමුන් සහ තරුණයින් ආරක්‍ෂාකාරීව තබා ගැනීම සඳහා කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට දැනුම, කුසලතා සහ දැනුවත්භාවය ඇත.**<br>ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 8 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br>8.1 සංවිධානයේ ළමා ආරක්‍ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් පුහුණු කරනු ලැබේ.<br>8.2 අනෙකුත් ළමයින්ගෙන් හා තරුණයින්ගෙන් සිදුවන හානිය ඇතුළු ළමා හානිය පිළිබඳ සලකුණු හඳුනා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින්ට පුහුණුව හා තොරතුරු ලැබේ.<br>8.3 ළමුන්ගේ ආරක්‍ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ගැටලුවලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින්ට පුහුණුව හා තොරතුරු ලබා දෙන අතර මෙම හානි අනාවරනය කරන සගයන්ට සහයෝගය ලබා දෙනු ලැබේ. 8.4 ළමුන් හා තරුණයින් සඳහා සංස්කෘතිකමය වශයෙන් ආරක්‍ෂිත පරිසරයක් ගොඩනඟන්නේ කෙසේද යන්න පිළිබඳව කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන්ට පුහුණුව සහ තොරතුරු ලැබේ. | වර්තමාන ළමා ආරක්‍ෂණ ප්‍රමිතිවලට අනුකූලව දැනටමත් සංවිධානයේ කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයින්ට තොරතුරු හා පුහුණුව ලබා දීමට ආයතනවලට අවශ්‍ය වන අතර එමඟින් ඔවුන්ට ළමා ආරක්‍ෂිත පරිසර නිර්මාණය කිරීමට සහ අපයෝජන චෝදනාවලට ප්‍රතිචාර දැක්වීමට හැකි වේ.<br>නව ළමා ආරක්‍ෂණ ප්‍රමිතිය 8 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් පුහුණු කිරීම සහ ඔවුන්ට සහය වීම සහ අඛණ්ඩ අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම සඳහා ආයතනවලට ඇති වගකීම් විස්තර කරයි:<br>• සංවිධානයේ ළමා ආරක්‍ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම<br>• හානිවල සංඥා හඳුනාගැනීම (අනෙක් ළමයින්ගෙන් හා තරුණ පිරිස්වලින් සිදුවන හානි ද ඇතුළත්ව)<br>• ළමා ආරක්‍ෂණ ගැටලුවලට සහ උත්සුකවලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සහ හානිය හෙළි කරන පුද්ගලයින්ට සහය වීම කළ යුතු වේ.<br>මෙම ප්‍රමිතිය නව ප්‍රමිති 1 සහ 5 සමග සම්බන්ධ වන අතර, ප්‍රමිති තුනම ළමයින්ට සහ තරුණයින්ට ආරක්‍ෂිත පරිසරයක් ගොඩනැගීම පිළිබඳව කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට පුහුණුව හා තොරතුරු සැපයීම සඳහා ආයතනවලට ඇති යුතුකම ස්ථාපිත කරයි.. | කොමිසමේ ළමා ආරක්‍ෂණ සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශය තුළ ළමයින් සහ තරුණයින් ආරක්‍ෂාකාරීව තබා ගැනීමට ස්වේච්ඡා සේවකයින්ට අවශ්‍ය දැනුම, හැකියාව හා දැනුවත්භාවය පිළිඹඳ තොරතුරු අඩංගු වේ. කොමිසම් සභාවේ වෙබ් අඩවියේ මෙම යෝජනා ක්‍රමයට යටත් වන සංවිධාන සඳහා වාර්තා කළ හැකි හැසිරීම් යෝජනා ක්‍රමය පිළිබඳ මග පෙන්වීම ඇත.<br>පාසල් සඳහා අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුවේ පාසල් සඳහා මග පෙන්වීම තුළ අපයෝජන සලකුණු පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු තිබේ.<br>ජාතික මූලධර්මය 7 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්‍ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |

| නව ළමා සුරක්ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
|---|---|---|
| **ළමා ආරක්ෂණ ප්‍රමිතිය 9 - භෞතික හා අන්තර්ජාල මාර්ගගත පරිසර තුළ ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරන අතර ළමයින්ට සහ තරුණයින්ට හානි කිරීමට ඇති අවස්ථාව අවම කෙරේ.**<br><br>ළමා ආරක්ෂණ ප්‍රමිතිය 9 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br><br>9.1 දරුවෙකුගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය, තොරතුරු ලබා ගැනීමේ පහසුව, සමාජ සම්බන්ධතා සහ ඉගෙනීමේ අවස්ථා බිඳීමකින් තොරව කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් **අන්තර්ජාල මාර්ගගත පරිසර** හා භෞතික පරිසරවල අවදානම් හඳුනාගෙන ඒවා අවම කරයි.<br><br>9.2 **අන්තර්ජාල** මාර්ගගත පරිසරය භාවිත කරනු ලබන්නේ සංවිධානයේ චර්යාධර්ම සංග්‍රහය සහ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තියට හා භාවිතවලට අනුකූලව ය.<br><br>9.3 අවදානම් කළමනාකරණ සැලසුම් මගින් ආයතනික සැකසුම්, ක්‍රියාකාරකම් සහ භෞතික පරිසරය විසින් ඇති කරන අවදානම් සලකා බලනු ලැබේ.<br><br>9.4 තෙවන පාර්ශවවලින් කොන්ත්‍රාත් පහසුකම් සහ සේවා සපයන සංවිධානවල ළමුන්ගේ හා තරුණයින්ගේ ආරක්ෂාව සහතික කරන ප්‍රසම්පාදන ප්‍රතිපත්ති තිබේ. | වර්තමාන ළමා ආරක්ෂණ ප්‍රමිතිවලට අනුකූලව දැනටමත් ආයතන විසින් භෞතික හා **අන්තර්ජාල** මාර්ගගත පරිසර හා සම්බන්ධ අවදානම් පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ළමා අපයෝජන අවදානම ඉවත් කිරීමට පියවර ගත යුතු වෙයි.<br><br>නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 9 ආයතන සඳහා පහත ඒවාට ඇති විශේෂිත වගකීම් පැහැදිලි කරයි:<br>• භෞතික පරිසරයන්ට අමතරව **අන්තර්ජාල** මාර්ගගත පරිසර සලකා බැලීම<br>• දරුවෙකුගේ හෝ තරුණයෙකුගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය, තොරතුරු ලබා ගැනීමේ පහසුව, සමාජ සම්බන්ධතා සහ ඉගෙනීමේ අවස්ථා බිඳීමකින් තොරව මෙම පරිසරවල ඇති අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම<br>• ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම මෙන්ම ළමයින්ට සහ තරුණයින්ට හානි කිරීමට ඇති අවස්ථාව අවම කිරීම<br>• සංවිධානය තෙවන පාර්ශවවලින් පහසුකම් සහ සේවා ගිවිසුම් ගත කරන්නේ නම් ළමුන්ගේ සහ තරුණයින්ගේ ආරක්ෂාව සහතික කරන ප්‍රසම්පාදන ප්‍රතිපත්ති තබා ගැනීම. | කොමිසමේ ළමා ආරක්ෂණ සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශය අපයෝජන අවදානම හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා උපදෙස් සපයයි.<br><br>කොමිසමේ COVID-19 වසංගතය තුළ ළමයින් සහ තරුණයින් අන්තර්ජාලය තුළ ආරක්ෂිතව තබා ගැනීම මගින් ප්‍රයෝජනවත් ඉඟි සහ සබැඳි සපයයි.<br><br>ළමයින් අන්තර්ජාලය තුළ ආරක්ෂිතව තබා ගැනීම සඳහා ඉ-ආරක්ෂණ කොමසාරිස් පුළුල් ප්‍රායෝගික උපදෙස් සපයයි.<br><br>ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ මාර්ගගත ආරක්ෂාව සඳහා පිරික්සුම් ලැයිස්තුව සහ ජාතික මූලධර්මය 8 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |

| නව ළමා සුරක්ෂණ ප්‍රමිති (2022 ජූලි 1 සිට) | නව හෝ වෙනස් වන දෙය මොනවාද? | ප්‍රයෝජනවත් සම්පත් |
| --- | --- | --- |
| **ළමා ආරක්ෂණ ප්‍රමිතිය 10 - ළමා ආරක්ෂිත ප්‍රමිති ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කර වැඩිදියුණු කරනු ලැබේ**<br>ළමා ආරක්ෂණ ප්‍රමිතිය 10 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br>10.1 සංවිධානය නිරන්තරයෙන් ළමයින්ගේ ආරක්ෂිත පිළිවෙත් සමාලෝචනය කිරීම, ඇගයීම සහ වැඩිදියුණු කිරීම සිදු කරයි.<br>10.2 අඛණ්ඩව වැඩිදියුණු කිරීම්වලට උපකාරී වීම සඳහාසහ හේතු සහ පද්ධතිමය දුර්වලතාහඳුනා ගැනීම සඳහා පැමිණිලි, උත්සුක සහ ආරක්ෂක කඩ කිරීමේ සිදුවීම් විශ්ලේෂණය කරනු ලැබේ.<br>10.3 කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයින්ට, ප්‍රජාව සහ පවුල්වලට සහ ළමුන්ට සහ තරුණයින්ට අදාළ සමාලෝචන මාර්ගයෙන් සොයා ගැනීම් පිළිබඳව සංවිධානය මගින් වාර්තා කරනු ලැබේ. | සමාලෝචනය සහ අඛණ්ඩව වැඩිදියුණු කිරීම දැනටමත් ළමා ආරක්ෂණ ප්‍රමිතිවල කොටසකි.<br>නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 10 ආයතන සඳහා පහත ඒවාට ඇති නව වගකීම් පැහැදිලි කරයි:<br>• අඛණ්ඩව වැඩිදියුණු කිරීම්වලට උපකාරීවීම සඳහාසහ හේතු සහ පද්ධතිමය දුර්වලතාහඳුනා ගැනීම සඳහා පැමිණිලි, උත්සුක සහ ආරක්ෂක කඩ කිරීමේ සිදුවීම් විශ්ලේෂණය කිරීම<br>• ළමුන්ගේ ආරක්ෂිත පිළිවෙත් පිළිබඳ අදාළ සමාලෝචන කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයින්ට, ප්‍රජාව සහ පවුල්වලට සහ ළමයින් සහ තරුණයින් වෙත වාර්තා කිරීම. | කොමිසම් සභාවේ ළමා ආරක්ෂණ සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වන මාර්ගෝපදේශය වර්තමාන ළමා ආරක්ෂිත ප්‍රමිතිවලට එදිරිව ඔවුන්ගේ ළමා ආරක්ෂණ රාමුව සමාලෝචනය කිරීමට ආයතනවලට උපකාර කිරීම සඳහා ස්වයං තක්සේරු කිරීමේ මෙවලමක් (Word ගොනුවක්ලෙස ලබා ගත හැකිය) සපයයි. නව ළමා ආරක්ෂණ ප්‍රමිතිවලට එරෙහි සමාලෝචන සඳහා නව මෙවලමක් ප්‍රකාශයට පත් කරනු ලැබේ.<br>ජාතික මූලධර්මය 9 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |
| **ළමා ආරක්ෂණ ප්‍රමිතිය 11 - ළමයින්ට සහ තරුණයින්ට සංවිධානය ආරක්ෂිත වන්නේ කෙසේද යන්න ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ලිඛිතව දක්වයි**<br>ළමා ආරක්ෂණ ප්‍රමිතිය 11 ට අනුකූලව, සංවිධානයක් අවම වශයෙන් සහතික කළ යුතු දේවල් වන්නේ:<br>11.1 ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සියලුම ළමා ආරක්ෂිත ප්‍රමිතිවලට අනුකූල වේ.<br>11.2 ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ලේඛනගත කර ඇති අතර තේරුම් ගැනීමට පහසුය.<br>11.3 හොඳම පුහුණු ආකෘති සහ පාර්ශ්වකරුවන්ගේ උපදේශන, ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමට උපකරණ වෙයි.<br>11.4 නායකයින් විසින් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූලත්වයට ප්‍රමුඛත්වය දීම සහ උදාහරණ වීම සිදු වේ.<br>11.5 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි තේරුම් ගෙන ක්‍රියාත්මක කරයි. | ළමා ආරක්ෂණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා පුළුල් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සකස් කිරීම වර්තමාන ළමා ආරක්ෂණ ප්‍රමිතිවලටඅනුකූලව දැනටමත් කළ යුතු වේ.<br>නව ළමා ආරක්ෂණ ප්‍රමිතිය 11 ආයතන සඳහා පහත ඒවාට ඇති නව යුතුකම් පැහැදිලි කරයි:<br>• ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි තේරුම් ගැනීමට පහසු කිරීම<br>• ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමට උපකරණ වීම සඳහා පාර්ශ්වකරුවන්ගේ උපදේශනය සහ හොඳම පුහුණු ආකෘති භාවිත කිරීම<br>• නායකයින් විසින් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූලත්වයට ප්‍රමුඛත්වය දීම සහ උදාහරණ වීම සිදු වීම තහවුරු කිරීම. | කොමිසම් සභාවේ ළමා ආරක්ෂණ සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශයෙහි වත්මන් ප්‍රමිති 2 හි කොටසේ නියැදි ප්‍රතිපත්ති සහ ප්‍රයෝජනවත් මග පෙන්වීම් සපයයි.<br>ජාතික මූලධර්මය 10 පිළිබඳ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ඉ-ඉගෙනුම් මොඩියුලය ප්‍රයෝජනවත් උපදෙස් සපයන අතර ළමා ආරක්ෂණ සංවිධාන ඉ-ඉගෙනුම් ද්වාරය හරහා ප්‍රවේශ විය හැකිය. |